*සියලු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 8 | විෂයය Subject: ඉතිහාසය | කාලය Time: පැය 02 |

## I කොටස

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මහා වැව් ඉදිකිරීමේ පුරෝගාමියා වූ වසභ රජතුමා විසින් ඉදිකරනු ලැබූ වැවක් ඇතුළත් පිළිතුර කුමක්ද ?
    (1). අභය වැව (2). කලා වැව
    (3). මහවිලච්චිය වැව (4). මින්නේරිය වැව

02. වැවක බිසෝකොටුවෙන් සිදු කරන කාර්ය වනුයේ,
    (1). වැව් බැම්ම සේදී යාම වැළැක්වීමයි.
    (2). වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම යි.
    (3). වැවේ ජලය ගොවි බිම්වලට මුදා හැරීමයි.
    (4). වැවේ අතිරික්ත ජලය පිට කිරීමයි.

03. අතීතයේ පරිසරය අලංකාර කිරීම සඳහා ඉදිකරනු ලැබූ පොකුණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1). කුට්ටම් පොකුණ (2). ඇත් පොකුණ
    (3). රන්මසු උයනේ පොකුණ (4). නෙළුම් පොකුණ

04. පුරාවිද්‍යා කැණීම්වලින් ශෛල්‍ය වෛද්‍ය උපකරණ හමුවන ස්ථානය සඳහන් පිළිතුර කුමක්ද?
    (1). පොළොන්නරුව ආළාහන පිරිවෙන් රෝහල
    (2). මිහින්තලය රෝහල
    (3). මැදිරිගිරිය රෝහල
    (4). මාලිගාවිල රෝහල

05. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,
    (1). සේනා සම්මත වික්‍රමබාහු රජු ය. (2). කරළියද්දේ බණ්ඩාර රජු ය.
    (3). ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ය. (4). කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.

06. දෙවන රාජසිංහ රජු උඩරට රාජ්‍යත්වයට පත් වීමට පෙර හැඳින්වූ නම කුමක්ද ?

(1). ටිකිරි කුමරු (2). කුණ්ඩසාලේ කුමරු

(3). මහා අස්ථාන කුමරු (4). මුත්තසාමි කුමරු

07. පත් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධත්වයටපත් ව තිබූ උඩරට ප්‍රදේශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1). කොත්මලේ (2). දුම්බර (3). වලපනේ (4). පිළිමතලාව

08. ලී කණු පුරුද්දා හෝ බාල්ක යොදා ඉදිකරනු ලැබූ ටැම්පිට විහාරයකට උදාහරණයක් වන්නේ,

(1). ගඩලාදෙණිය විහාරය යි. (2). ලංකාතිලක විහාරය යි

(3). දෙගල්දොරුව විහාරය යි. (4). මැදවෙල විහාරය යි.

09. ඉතාලියේ පිහිටි වෙළෙඳ නගරයක් නොවන්නේ,

(1). වැනීසිය (2). කොන්ස්තන්තිනෝපලය

(3). ජිනෝවා (4). ප්ලෝරන්ස්

10. පුනරුද සමයේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගත් පුද්ගලයා සඳහන් පිළිතුර තෝරන්න.

(1). මයිකල් සර්වේස් (2). මාටින් ලූතර්

(3). ජොහැන්සන් ගුටෙන්බර්ග් (4). අයිසෙක් නිව්ටන්

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර පහත වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

11. කුටකණ්ණතිස්ස රජතුමා විසින් ……………………………….. නමින් උයනක් ඉදිකරනු ලැබිණි.

12. අතීතයේ උද්‍යාන පාලකයන් හඳුන්වා ඇත්තේ ……………………….. ලෙස ය.

13. කෝට්ටේ රාජ්‍ය සමයේ උඩරට කැරැල්ලක් ඇති කරනු ලැබුවේ …………………………….. සිටුවරයා විසිනි.

14. …………………………….. පවුල පුනරුද සමයේ ඉතාලියේ විසූ ධනවත් පවුලකි.

15. පුනරුද සමයේ මිනිසා උසස් කොට සැළකීම ……………………………….. නමින් හඳුන්වයි.

**(මෙඩිචි / පාදුවා / උයන්කැමි / මානවවාදය / කෙත් වැජැරුම / ජෝතිය / දේව වරම්වාදය / පද්මස්වර)**

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල A තීරුව B තීරුව සමග ගලපන්න.**

| | A | B |
|---|---|---|
| 16. | නිකලස් කොපර්නිකස් | a). ඉතාලි ජාතික කතුවරයෙකි. |
| 17. | මාර්ටින් ලුතර් | b). කැලිකට් නගරයට ගොඩ බැසීම |
| 18. | අලිගියරි ඩාන්ටේ | c). ඩේවිඩ්ගේ ප්‍රතිමාව |
| 19. | වස්කෝද ගාමා | d). රෙපරමාදු ව්‍යාපාරය |
| 20. | මයිකල් ආන්ජිලෝ | e). තාරකා විද්‍යාවේ පියා |

(ලකුණු 2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. A හා B පින්තූර හඳුනාගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A රූපය

(i). A රූපයේ දැක්වෙන රජු නම් කරන්න.

(ii). එතුමා රාජ්‍යත්වයට පත්වීමට පෙර හැඳින්වූ නම කුමක්ද ?

(iii). එතුමා කුමන රාජවංශයට අයත් ද ?

(iv). බ්‍රිතාන්‍යන් විසින් මෙතුමා පිටුවහල් කළ ප්‍රදේශය කුමක්ද ? (ල.2x4=8)



B රූපය

(i). B රූපයේ දැක්වෙන චිත්‍රය නම් කරන්න.

(ii). එම චිත්‍රය අඳින ලද ශිල්පියා කවුද ?

(iii). ඔහු කුමන ජාතිකයෙක් ද ?

(iv). ඔහු විසින් අඳිනු ලැබූ තවත් චිත්‍රයක් නම් කරන්න.

(ල.2x4=8)

02. (i). මහාවංසයේ සඳහන් පරිදි පණ්ඩුකාභය රජු විසින් ඉදිකරනු ලැබූ වැව් දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ii). අතීතයේ වාරි කර්මාන්ත කටයුතු වලදී ඇළ මාර්ග ඉදිකිරීම හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ල.4)

(iii). සීගිරි ජල උද්‍යානය තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

03. (i). චේතියඝර හෙවත් වටදාගෙවල් පැවති බවට සාධක හමුවන චෛත්‍ය දෙකක් ලියා දක්වන්න. (ල.2)

(ii). ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණය සම්බන්ධයෙන් සාක්ෂි ලැබෙන ස්ථාන දෙකක් නම් කරන්න. (ල.4)

(iii). පැරණි ශ්‍රී ලංකාවේ කැටයම් හා මූර්ති කලාවේ දියුණුව පිළිබඳව උදාහරණ තුනක් දක්වා ඉන් එකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

04. (i). මහනුවර රාජධානිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල.2)

(ii). පෘතුගීසීන් හා උඩරට පාලකයන් අතර ඇති වූ සටන් හතරක් නම් කරන්න. (ල.4)

(iii). පළමුවන විමලධර්මසූරිය රජුගේ වැදගත්කම පිළිබඳව කරුණු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

05. (i). උඩරට සමාජය තුළ පැවති විවාහ ක්‍රම දෙකක් ලියා දක්වන්න. (ල.2)

(ii). මහනුවර යුගයේ චිත්‍ර කලාවේ පැවති ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල.4)

(iii). මහනුවර යුගයේ ආර්ථික කටයුතු සිදු වූ ආකාර තුන ලියා එකක් විස්තර කරන්න. (ල.5)

06. (i). මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්ව විද්‍යාල දෙකක් නම් කරන්න. (ල.2)

(ii). පහත සඳහන් කලා නිර්මාණවල, නිර්මාණකරුවා නම් කරන්න.

A. අන්තිම භෝජන සංග්‍රහය

B. පියෙටා ප්‍රතිමාව

C. දුරදක්නය

D. ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව

(ල.4)

(iii). පුනරුදය ඇති වීමට බලපෑ හේතු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

07. (i). පුනරුද සමයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුවට කටයුතු කළ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න. (ල.2)

(ii). පුනරුද සමයේ චිත්‍ර වල දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල.4)

(iii). දේශගවේෂණවලට බලපෑ හේතු තුනක් ලියා විස්තර කරන්න. (ල.5)